// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/61 - 2018 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### බස්නාහිර පළාතේ පළාත් සභාවේ මෝටර් රථ ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මෝටර් රථ ප්‍රඥප්ති කෙටුම්පත පහතින් සඳහන් කරමි.

**කැප්ටන් ලලිත් වනිගරත්න,**
බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර, සංවර්ධන
හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 204හි
බස්නාහිර පළාත් මාර්ග ප්‍රවාහන, සමුපකාර, සංවර්ධන හා
වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත
සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේදී ය.

1A - PG 4279 — 12 (2018/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ මෝටර් රථ ප්‍රඥප්තිය**

බස්නාහිර පළාත තුළ මෝටර් වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ඊට අදළ බලපත්‍ර ගාස්තු අය කිරීම සහ බස්නාහිර පළාතේ 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාද ඊට ආනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය.*

1. මෙම ප්‍රඥප්තිය 2018 අංක ...... දරන බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැති ය ලද දින සිට ක්‍රියාත්මක වන්නේය.

*දෙපාර්තමේන්තු පිහිටුවීම.*

2. මෙම ප්‍රඥප්තියෙහි කාර්යය සඳහා (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) බස්නාහිර පළාතේ මෝටර් රථ දෙපාර්තමේන්තුව මෙයින් පිහිටුවනු ලබයි.

*දෙපාර්තමේන්තුවේ අරමුණු.*

3. බස්නාහිර පළාතට අයත් වාහන සම්න්ධයෙන් නීති මගින් නියම කරනු ලැබිය හැකි සීමා ඇතුළත යම් නිදහස් කිරීම්වලට යටත්ව මෝටර්වාහන සඳහා වූ කවර හෝ බලපත්‍ර සම්බන්ධයෙන් වූ ගාස්තු අයකර ගැනීම සඳහා ක්‍රියාකිරීම දෙපාර්තමේන්තුවෙහි අරමුණ වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියා.*

4. (1) දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා පත්කරන මෙහි මින් මතු ''කොමසාරිස්'' යනුවෙන් හඳුන්වනු ලබන බස්නාහිර පළාතේ මෝටර් රථ කොමසාරිස්, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කලින් කල බස්නාහිර පළාත් මෝටර් රථ නියෝජ්‍ය කොමසාරිස්, බස්නාහිර පළාත් මෝටර් රථ සහකාර කොමසාරිස්වරුන්, මෝටර් රථ පරීක්ෂකවරුන් සහ අවශ්‍ය විය හැකි සෙසු නිලයන් පත් කරනු ලැබිය හැකිය.

(3) මෙම වගන්තිය යටතේ වන පත්කිරීම් සම්බන්ධයෙන් වරින්වර සංශෝධිත පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය.

(4) කොමසාරිස්, අමාත්‍යාංශ ලේකම්ගේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත්ව ක්‍රියා කළ යුතු ය.

5. මෙම ප්‍රඥප්තිය යටතේ කොමසාරිස් වෙත පවරා ඇති බලතල කිසිවක් කොමසාරිස් විසින් දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කවර හෝ රාජ්‍ය නිලධාරියෙකු වෙත හෝ පවරා දිය හැකිය.

*කොමසාරිස්වරයාගේ බලතල හා කාර්යය*

6. කොමසාරිස්වරයාගේ බලතල හා කාර්යන් පහත සඳහන් ආකාරයට වන්නේ ය :

(1) බස්නාහිර පළාත තුළ පදිංචි කවර හෝ තැනැත්තකුගේ සන්තකයේ ඇති හෝ පාවිච්චියේ ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නීති මගින් නියම කරනු ලැබ ඇති ආකාරයට ආදායම් බලපත්‍රයක්, වෙළෙන්දෙකුගේ බලපත්‍රයක්, ආගන්තුකයෙකුගේ මෝටර් වාහනයක් සඳහා වන තාවකාලික බලපත්‍රයක් හෝ වෙනත් කවර හෝ මෝටර් වාහන බලපත්‍රයක් වෙනුවෙන් නීති මගින් නියම කරන ආකාරයට හා ප්‍රමාණයට ගාස්තු අය කිරීම, අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් වූ අදාල බලපත්‍ර ඊට අදාල නීතියේ සඳහන් විධිවිධානයන්ට අනුව නිකුත් කිරීම හා නොගෙවන ලද කවර හෝ මෝටර් වාහන බලපත්‍රයක් සඳහා වූ ගාස්තු මෙම ප්‍රඥප්තිය යටතේ විධිවිධාන සලසන ආකාරයට අයකර ගැනීම;

(2) මෝටර් වාහන සම්බන්ධයෙන් නීතියෙහි සඳහන් කවර හෝ අධිකාරීත්වයක් සතු බලතල එකී නීතියෙහි සඳහන් පරිදි අදාල අධිකාරීත්වය විසින් පවරන ලද අවස්ථාවක, එසේ පවරන ලද ප්‍රමාණයට ඊට අදාල බලතල ක්‍රියාත්මක කිරීම;

(3) ඉහත 6(1) හා 6(2) සම්බන්ධව කටයුතු ඉටුකිරීමේදී අවශ්‍යවන්නා වූ නවීන තාක්ෂණය භාවිතා කර පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම කොමසාරිස්වරයාගේ කාර්යයකි;

(4) බස්නාහිර පළාත ඇතුළත මෝටර් වාහන මගින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ සේවා සහ භාණ්ඩ ගෙන යාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම;

(5) කොමසාරිස්වරයාගේ බලතල හා කාර්යය, ඉහත නීතිය හා ක්‍රියාමාර්ගයන්ගෙන් ගනු ලබන තීන්දු, තීරණයක්, පුද්ගලිකව වගකීමට නොබැඳිය යුතුය.

7. (1) පළාත තුළ මෝටර් වාහනයක් වෙනුවෙන් කවර හෝ බලපත්‍රයක්, තාවකාලික බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම ඊට අදාල ලිඛිත නීතියෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූලව ඉල්ලුම් කළ යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම.

(2) බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක්ම කොමසාරිස්වරයා වෙත හෝ කොමසාරිස්වරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලද බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඉල්ලුම් කළ යුතු ය.

(3) කොමසාරිස්වරයා හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් තමා වෙත ඒ සඳහා වන නියමිත බලපත්‍ර ගාස්තු ගෙවා නොමැත්තේ නම් හා නීතියෙහි ඒ සඳහා වන විධිවිධාන ඉල්ලුම්කරු නිසියාකාරව සම්පූර්ණ කර නොමැත්තේ නම් කවර බලපත්‍රයක් හෝ නිකුත් කිරීම නොකළ යුතුය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු අයකිරීම සහ ඊට අදල බලපත්‍ර නිකුත් කිරීම නීතිය මගින් නියම කරනු ලබන සීමා ඇතුළත සහ නිදහස් කිරීම්වලට යටත්ව විය යුතුය.

බලපත්‍ර ගාස්තු ගෙවීම.

8. (1) නීතිය මගින් නියම කරනු ලබන ආකාරයටම කවර හෝ මෝටර් වාහන බලපත්‍රයකට හෝ තාවකාලික බලපත්‍රයකට යටත් බස්නාහිර පළාතට අයත් වාහනයක්, නියමිත බලපත්‍ර ගාස්තු ගෙවා ලබාගත් අදාල බලපත්‍රය බලාත්මක නොවන්නා වූ අවස්ථාවක කිසිම තැනැත්තෙකු විසින් සන්තකව තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේදී අධිකාරිය වශයෙන් මෝටර් රථ රෙජිස්ට්‍රාර්, මෝටර් රථ කොමසාරිස්, ගම්පහ, කොළඹ, කළුතර දිසාපතිවරුන් හෝ බස්නාහිර පළාතට අයත් වාහනයක් සේ සැලකේ.

(3) 7 (3) හි කෙසේ සඳහන් වුවද විශේෂ අවස්ථාවන්වල දී ගාස්තු අයකර ගැනීම හෝ හෝ නොගැනීම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද දෙපාර්තමේන්තුගත කමිටුවක් විසින් තීරණය කළ හැක.

9. (1) බස්නාහිර පළාතට අයත් වාහනයක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ගත යුතු මෝටර් වාහන බලපත්‍රයක් හෝ තාවකාලික බලපත්‍රයක් සඳහා ගාස්තු නොගෙවා ඇති අවස්ථාවක ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු, බලපත්‍ර ගාස්තු නොගෙවීම මත අයකළ යුතු අධි ගාස්තු වටිනාකමද සහිත සම්පූර්ණ ගාස්තු වටිනාකම ගෙවීම් කිරීම සඳහා ලබා දෙන අවසාන දිනය ඇතුළත් වන පරිදි කොමසාරිස්වරයා විසින් හෝ නිශ්චිතම බලය පවරන ලද නිලධාරි විසින් සහතික කරන ලද දැන්වීමක් මගින් අදාල මෝටර් වාහනයේ අයිතිය ඇති තැනැත්තා වෙත හෝ සන්තකය ඇති තැනැත්තා වෙත ලිඛිතව දැන්විය යුතුය.

ඉහත උපවගන්තිය යටතේ ගෙවීම් කිරීම සඳහා ලබා දෙන උපරිම කාල සීමාව දැන්වීම නිකුත් කරනු ලබන දිනෙන් දින තිහක කාල සීමාවක් නොඉක්මවන දිනයක් විය යුතුය.

(2) මෙම වගන්තියෙහි (1) වන වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් දක්වා සිටින පරිදි වූ ගාස්තු ප්‍රමාණයන්, යම් තැනැත්තෙකු දැන්වීමේ සඳහන් පරිදි නොගෙවන අවස්ථාවකදී කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ඇති නිලධාරියෙකු විසින් එම තැනැත්තාගෙන් අයවිය යුතු සම්පූර්ණ මුදල් ප්‍රමාණය, එම තැනැත්තාගේ නම, මෝටර් වාහනයෙහි ලියාපදිංචි අයිතිය හෝ අවස්ථාවෝචිත පරිදි පදිංචිය හෝ ව්‍යාපාරික ලිපිනය පිළිබඳ විස්තර අඩංගු සහතිකයක් එම සහතිකයේ සඳහන් ලිපිනයට අදාල අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින් හේතු දක්වීමට ඒ තැනැත්තා තමා ඉදිරියට කැඳවිය යුතුය. තවද ඒ තැනැත්තා ඊට අදාල ප්‍රමාණවත් හේතු නොදැක්වුවහොත් සහතිකයෙහි සඳහන් ගාස්තු මුදල, පැහැරහරින්නා වෙතින් දණ්ඩනය නියමයන් මගින් නියම කරනු ලබන දඩයක් ලෙස අයකරනු ලැබිය යුතු අතර එම දඩ මුදල පළාත් සභා අරමුදලට බැර විය යුතුය.

රීති සෑදීමේ බලය. 10. (1) මෙම ප්‍රඥප්තියේ 7, 8 වෙනි හා 9 වෙනි වගන්තිවල සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාල පටිපාටි නියම කිරීමද ඇතුළුව මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවේ අරමුණු ක්‍රියාත්මක කිරීම පිණිස වූ කවර හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එය පළවූ දිනයේ සිට හෝ *ගැසට් පත්‍රයේ* සඳහන් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද රීති ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව එකී රීති අනුමත කර එකී අනුමැතිය පිළිබඳව ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කළ යුතුය.

ඒ අයුරින් අනුමත කරනු නොලැබුවහොත් ඒ බවද ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කළ යුතු අතර එදින සිට එම රීති යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියකින් තොරව පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතුය.

අන්තර්කාලීන විධිවිධාන. 11. (1) මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) එසේ වුවද 1991 අංක 07 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ මෝටර් රථ දෙපාර්තමේන්තුව සතුව තිබූ :

(*අ*) සියළු චංචල හා නිශ්චල දේපල ;
(*ආ*) සියලු වත්කම් හා බැරකම් ;
(*ඇ*) සියළු වගකීම් හා බැඳීම් ;

මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුව සතු චංචල හා නිශ්චල දේපල, වත්කම් හා බැරකම් හා වගකීම් හා බැඳීම් වශයෙන් සැලකිය යුතුය.

(3) 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැලකිය යුතුය.

(4) 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුවට එරෙහිව පවරන ලද සෑම නඩුවක්ම මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූවක් සේ සැලකිය යුතුය.

අර්ථ නිරූපනය. 12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ-

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාද,

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ මෝටර් වාහන විෂයභාර අමාත්‍යවරයාද,

''අමාත්‍යාංශ ලේකම්'' යන්නෙන් බස්නාහිර පළාතේ මෝටර් වාහන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වන්නේය,

''මෝටර් වාහන'' යන්නෙන් මෝටර් වාහන පනතේ දී ඇති අර්ථයම අදහස් වන්නේය,

''නීතිය'' යන්නෙන් වරින් වර සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනත හා එම පනතේ හෝ ඊට ආනුශාංගික කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන කවර හෝ පනතක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව 13. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

10-1408

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.